" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත

# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்

# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/02-63/FI/04 (B) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2023.07. 7 |
|---|---|---|---|---|---|

ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,

ලේකම්, සභා ලේකම් කාර්යාලය,

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

ලේකම්, (පළාත් පාලන/අධ්‍යාපන/ කෘෂිකර්ම/ ප්‍රවාහන/ සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ පිරිස් හා පුහුණු/ මූල්‍ය/ සැලසුම්/ ඉංජිනේරු),

ආදායම් කොමසාරිස්, ආදායම් දෙපාර්තමේන්තුව(බ.ප.)

අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන අංශය,

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය ආයතනවල කාර්ය සාධන ඇගයීමේ වැඩසටහනේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ අංක WP/MPR/ADM/17/3/2 හා 2023.07.04 දිනැති ලිපිය හා බැඳේ.

02. උක්ත ලිපිය මගින් බස්නාහිර පළාත් රාජ්‍ය ආයතනවල කාර්ය සාධන ඇගයීමේ වැඩසටහනේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා වන කාලයට අමතරව සතියක කාලයක් ලබාදෙන ලෙස ඉල්ලා ඇත.

03. ඒ අනුව මේවන විට කාර්ය සාධන ඇගයීමේ සංරචක ලේඛනය ඇතුලත් ගූගල් පෝරමය සම්පූර්ණ කර උඩුගත කිරීම (upload) සීමිත ආයතන ප්‍රමාණයක් පමණක් සිදු කර ඇති බැවින් තරඟාවලිය සඳහා ලියාපදිංචි වී ඇති සියලුම ආයතන සඳහා ගූගල් පෝරමය සම්පූර්ණ කර උඩුගත කිරීමට (upload) ලබා දී ඇති කාලය 2023.07.19 දින දක්වා දීර්ඝ කර ඇති බව කාරුණිකව දන්වා සිටින අතර මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය/ ආයතනය යටතේ, තරඟාවලිය සඳහා ලියාපදිංචි වී ඇති ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙසද දන්වා සිටිමි.

04. බස්නාහිර පළාත් රාජ්‍ය ආයතනවල කාර්ය සාධන ඇගයීමේ වැඩසටහනේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීමේ වැඩකටයුතු ඉහත සඳහන් දිනට පෙර සිදුකර තරඟාවලියේ තුන්වන අදියර ක්‍රියාත්මක කිරීම, නියමිත දිනට ආරම්භ කිරීම සඳහා ඔබගේ සහයෝගය හා සක්‍රීය දායකත්වය ලබාදෙන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

ජේෂලා අබේසූරිය,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

අත්/කලේ : ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත : ප්‍රධාන ලේකම් සම්බන්ධීකරණ ලේකම් - කරු.දැ.ගැ.ස.